# පුවත් විවරනිකා - අංක 01(2023/24)

## 01. විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමය - සක්‍රීය සේවයේ නියුතු සාමාජික වෛද්‍යාධාර ක්‍රමය සමඟ සම කිරීමේ ඉල්ලීම හා එහි නව ප්‍රවනතා

වර්ෂ ගණනාවක් තිස්සේ සංගමය විසින් දිගින් දිගටම කරනු ලබන මෙම සාධාරණ ඉල්ලීම මහා කළමනාකරුවන් තිදෙනකුගේ සේවාකාලයන් පසුකර සිව්වන මහා කළමනාකරුගේ කාලය දක්වා විසඳුමකින් තොරව අතිනත මාරු වෙමින් යයි. මහජන බැංකුවේ හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ විශ්‍රාමිකයන් දැනටමත් භුක්ති විඳින මෙම පහසුකම ලබා දීමට අපගේ මහා කළමනාකරුවන් මෙතරම් උදාසීන බවක් දක්වන්නේ ඇයි? අප සංගමය පළමු වරට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කළේ ඩී.එම්. ගුණසේකර මහතා මහා කළමනාකරු වශයෙන් සිටියදී ය. මේ සම්බන්ධව සාකච්ඡා වට කීපයක් පැවැත්වුවද අපගේ මුඛ්‍ය ඉල්ලීම ඉටු කිරීම වෙනුවට ඔහු කළේ පැවති විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමයට 15% ක වැඩිවීමක් ලබාදීම පමණකි. ඉන්පසුව ප්‍රශ්නය යොමු වූයේ සෙනරත් බණ්ඩාර මහතා වෙතයි. ප්‍රශ්නයට ස්ථාවර විසඳුමක් ලබා දෙනු වෙනුවට අඳුරේ අතපත ගාන්නකු සේ ක්‍රියා කළ ඔහු සංගමයේ දැඩි ඉල්ලීම මත සාකච්ඡා වට කිහිපයක් පැවැත්වුවද ප්‍රශ්නයට නිසි විසඳුමක් ලබාදීම වෙනුවට ඔහු කළේ ද පවතින විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමයට 8% ක වැඩි කිරීමක් ලබාදීම පමණි. අනතුරුව මහා කළමනාකාර ධුරයට පත්වූ කේ.ඊ.ඩී. සුමනසිරි මහතා ලංකා බැංකු සේවක සංගමයේ සාමාජිකයෙකු ද වූ බැවින් තම සහෝදර විශ්‍රාමික සාමාජිකයන් මුහුණ දී සිටින ප්‍රශ්නය අවබෝධ කර ගනිමින් එයට ස්ථිරසාර විසඳුමක් ලබා දෙනු ඇතැයි පැවති විශ්වාසය මත බොහෝ දෙනෙක් ඔහු කෙරෙහි බලාපොරොත්තු දල්වාගෙන සිටියහ. සාකච්ඡා වට කිහිපයක් ලබා දුන්නද සංගමය විසින් ඉදිරිපත් කළ කරුණු වලට අවධානය යොමු කරන බවක් පෙන්නුවද ඔහුට ආවේණික ලිස්සායාමේ ප්‍රතිපත්තිය මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ද අනුගමනය කළේය. අවසාන සාකච්ඡාවේදී ඔහු සඳහන් කර සිටියේ තමා නොබෝ දිනකින් විශ්‍රාම ගන්නා බැවින් නව මහා කළමනාකරු සමග ප්‍රශ්නය විසඳා ගන්නා ලෙසයි.

දැන් ප්‍රශ්නය සිව්වන මහා කළමනාකරු අතටත් පැමිණ ඇත. නව මහා කළමනාකරු රසල් ෆොන්සේකා මහතා දැඩි මූල්‍ය විනයකින් කටයුතු කරන අයකු

බවත් යම් ප්‍රශ්නත් විසඳාලිය හැකි නම් ඍජුවම එය විසඳීමට කටයුතු කරනබවත් බහුතරයේ පිළිගැනීමය. සංගමය ඔහු සමඟ පසුගිය මාර්තු මාසයේ මුල් සතියේ දී සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී විශ්‍රාමික වෛද්‍යාධාර වැඩි කළ යුතු බව එහිදී ඔහු පිළිගන්නා ලදී. එසේම අප මුහුණ දෙමින් සිටින ආර්ථික අපහසුතා නිසා මෙම යෝජනාව වසරේ දෙවන කාර්තුවෙන් පසුව සලකා බැලිය හැකි බවත් ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. මේ වන විට දෙවන කාර්තුව ද අවසන් වී ඇත. මෑතකදී විශ්‍රාම භාර අරමුදලේ භාරකරුවන් සමඟ පැවැති සාකච්ඡාවේදී ඔහු සඳහන් කළේ මුදල් අමාත්‍යාංශය විසින් දැනට මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් පනවා ඇති ඇතම් සම්බාධක නිසා ප්‍රශ්නයට විසඳුමක් සෙවීමේ යම් අපහසුතාවයන් පවතින බවත් ඒවා සමථයකට පත් කර ගැනීමට කටයුතු කළ යුතු බවත් ය.

මේ අතරතුර බැංකුවේ මානව සම්පත් අංශය මගින් ලිපියකින් සංගමය වෙත දැනුම් දුන්නේ මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුවේ (H.R.P.C.) තීරණයක් අනුව විශ්‍රාමික වෛද්‍යාධාර ක්‍රමයේ B කාණ්ඩයේ දීමනා පමණක් 10% කින් වැඩි කිරීමට ඔවුන් තීරණය කර ඇති බවයි. මෙහිදී සංගමයේ ස්ථාවරය වූයේ යෝජිත වැඩිවීම කිසිසේත් ප්‍රමාණවත් නොවන නිසා පිළිගත නොහැකි බවයි.

බැංකු වෙත දැනට පනවා ඇතැයි පැවසෙන සම්බාධක අතික්‍රමණය කරමින් යම් ධනාත්මක ප්‍රවේශයකට එළැඹීමට බැංකුවට හැකිවනු පිණිස පහත සඳහන් සාධනීය යෝජනා සංගමය විසින් කළමණාකාරිත්වය ඉදිරිපත් කර ඇත.

- සාමාජිකයන්ගේ වැටුපෙන් දැනට වෛද්‍යාධාර ක්‍රමය වෙත කරනු ලබන දායකත්වය 0. 1% සිට 0.2% දක්වා වැඩි කිරීම.
- වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලේ (WW&OP) ආයෝජන ආදායමින් (Investment Income) දැනට ලබා දෙනු ලබන 5% ප්‍රතිශතය අවශ්‍ය වුවහොත් වැඩි ප්‍රතිශතයක් දක්වා ඉහලට ගෙන ඒම
- වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලින් රුපියල් බිලියනයක මුදලක් වෛද්‍යාධාර අරමුදලට මාරු කිරීම.

අප සංගමයේ සභාපතිවරයා බැංකුවේ සභාපතිවරයා හා මානව සම්පත් නියෝජ්‍ය මහා කළමනාකාරතුමා සමග පවත්වන ලද නිල නොවන මට්ටමේ සාකච්ඡාවක දී ඉහත දැක්වෙන කරුණු සාකච්ඡාවට බඳුන් වී ඇති අතර එහිදී ලංකා

බැංකු සභාපතිවරයා ඊට එකඟතාවය පළ කර ඇත. මේ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ඔහු විසින් නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්) වෙත එහිදී ලබාදී ඇති අතර මේ යෝජනා මත පදනම්ව ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන සංදේශයකට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදීමට ක්‍රියාකරන බව ද සභාපතිවරයා එහිදී ප්‍රකාශ කර ඇත.

2023.07.26 දින පැවති කමිටු රැස්වීමේදී මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මහා කළමනාකරු හමුවී සාකච්ඡා කිරීමට ඉක්මන් දිනයක් ලබා ගැනීමට ද තීරණය විය.

**02.** <u>විශ්‍රාමික සංගමයට තේමා ගීතයක්</u>

අප සංගමයේ උත්සව අවස්ථා වලදී තේමා ගීතය වශයෙන් භාවිතා කරන්නේ ලංකා බැංකු තේමා ගීතයයි. මේ සඳහා සංගමයට අනන්‍ය වූ තේමා ගීතයක් තිබීමේ අවශ්‍යතාවය පිළිබඳ අදහස පසුගිය වසරේ පැවති පාලන කමිටුවට එහි ලේකම්වරයා වූ වී. රාජේන්ද්‍රන් මහතා විසින් ඉදිරිපත් කරන ලදී. එම අදහස පාලන කමිටුව විසින් ඒකමතිකව අනුමත කළ අතර ඒ සඳහා සුදුසු ගී පද රචනා විශ්‍රාමිකයන්ගෙන් කැඳවා ඒ අතරින් සුදුසු ගීත රචනාවක් තෝරා ගැලපෙන සංගීතඥයෙකු ලවා ස්වර රචනා හා සංගීත සංයෝජන කර තේමා ගීතය නිර්මාණය කිරීමේ කටයුතු මෙහෙයවීම සඳහා ලලිත් හේමසිරි, පී. වීරසිංහ සහ එම්. වික්‍රමසිංහ යන මහත්වරුන්ගෙන් යුතු කමිටුවක් පත්කරන ලදි. අපගේ සියලු විශ්‍රාමිකයන්ට මේ සඳහා විවෘත ආරාධනයක් කෙරුණු අතර ඊට ප්‍රතිචාර වශයෙන් ගී පද රචනා 29 ක් (විසිනවයක්) අප වෙත ලැබිණ. (ගී පද රචනාවලක් ඉදිරිපත් කර ඇති බැවින් එම්.වික්‍රමසිංහ මහතා තාවකාලිකව ඔහු දැරූ කමිටු සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වූ අතර ඒ වෙනුවට වී. රාජේන්ද්‍ර මහතා කමිටු මේ කටයුතු ආවරණය සඳහා පත්විය.)

ප්‍රවීන සංගීතඥ රංජිත් බාලසූරිය මහතා ඉදිරිපත් වූ ගී පද රචනා අතුරින් සංගමයේ තේමා ගීතය නිර්මාණය කිරීම සඳහා වඩාත් සුදුසු නිර්මාණය ලෙස අපගේ කොළඹ දිස්ත්‍රික් සාමාජික දේ.වි ගාල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ගී පද රචනාව නිර්දේශ කරන ලදි.

ඉදිරි කාලයේ දි සුදුසු තනු නිර්මාණයන් හා සංගීත සංයෝජනයන් යොදා ගනිමින් තේමා ගීතය එළි දැක්වීම සංගමයේ අපේක්ෂාවයි.

**03. <u>දිස්ත්‍රික් සංගම් වලට ත්‍රෛමාසිකව ලබා දෙනු ලබන සාමාජික මුදල් මාසිකව ලබා දීමට පාලන කමිටුව තීරණය කරයි.</u>**

අප සංගමයේ පාලන කමිටුව මෑතකදී ගත් තීරණයකට අනුව මෙතෙක් ත්‍රෛමාසිකව දිස්ත්‍රික් සංගම් වලට ලබාදුන් සාමාජික මුදල් 2023 ජූලි මස සිට මාසිකව ලබා දෙනු ලැබේ. ඒ සඳහා දිස්ත්‍රික් සංගම් විසින් මාසිකව ගිණුම් වාර්තා මව් සංගමය වෙත යොමු කළ යුතුවේ. මුලදී සාමජිකයන් විසින් ගෙවූ රු.150/= මුදලින් මව් සංගමය රු.50/= තබාගෙන රු.100/= දිස්ත්‍රික් සංගම් වලට ප්‍රේෂණය කල අතර සාමාජික මුදල රු.250/= දක්වා වැඩි කිරීම නිසා මව් සංගමයේ කටයුතු සඳහා රු.85/= රඳවා ගෙන රු.165/= ක් දිස්ත්‍රික් සංගම් වලට මාසිකව ප්‍රේෂණය කිරීමට දැනට කටයුතු යොදා ඇත.

**04. <u>වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල කාන්තා සාමාජිකයන්ට සහනයක්</u>**

දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳී පැවති ප්‍රශ්නයක් වූ විශ්‍රාම ලැබීමෙන් පසුවත් 70 වන විය දක්වා තම විශ්‍රාම වැටුපෙන් උක්ත අරමුදලට දායකත්වය සැපයීමට සිදු වූ කාන්තා සාමාජිකයන්ගේ ප්‍රශ්නය දැනට නිරාකරණය වී ඇත. වර්ෂ ගණනාවක් තිස්සේ බැංකුවේ පැවැති විශ්‍රාම භාර අරමුදල්, සංවත්සර මහා සභා රැස්වීම් වලදී මෙන්ම විශ්‍රාමික සංගමයේ සංවත්සර මහා සභා රැස්වීම් වල ද එකසේ රැව් පිළිරැව් දුන් මෙම ප්‍රශ්නය හැමවිටම නැවතුනේ විසඳුමකින් තොරවය. අප සාමාජිකාවන්ගේ දැඩි කනස්සල්ලට හේතු වූ මෙම ප්‍රශ්නය ඔවුන් වෙත දැඩි ආර්ථික පීඩනයක් ද ඇති කළේය.

2019 ජුනි මස 30 දින වන විට බැංකුවට බැඳුනු දිනයේ සිට මාස 420 ක් සාමාජික මුදල් ගෙවා සම්පූර්ණ කර ඇති සාමාජිකාවන්ගේ දායක මුදල් ගෙවීම අත්හිටුවීමට ද 2019 ජූලි මස සිට අද වන තෙක් ගෙවා ඇති අතිරික්ත දායක මුදල් ආපසු ගෙවීමට ද කළමණාකාරීත්වය තීරණය කර ඇත.

## 05. ලංකා බැංකුවේ විශ්‍රාමික සංගමයේ වෙබ් පිටුවට නව මුහුණුවරක්

විශ්‍රාමිකයන්ගේ සංගමයේ යාවත්කාලීන තොරතුරු පහසුවෙන් සාමාජිකයන් අතට පත් කිරීමේ හා සාමාජිකයන් අතර යහපත් සන්නිවේදන සංස්කෘතියක් ගොඩනැගීමේ අරමුණෙන් සංගමයේ වෙබ් අඩවිය වැඩි දියුණු කිරීමේ කටයුතු ඒ පිළිබඳ පත්කර ඇති අනු කමිටුව විසින් මේ දිනවල පත් කර ගෙන යනු ලබයි. වෙබ් ලිපින https://bocpenasso.com භාවිතා කර සාමාජික සාමාජිකාවන්ට ඊට ප්‍රවේශ විය හැක. වෙබ් පිටුවේ පළ කිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්ක වල වැදගත් තොරතුරු දිස්ත්‍රික් ලේකම්වරයා මගින් මව් සංගමය වෙත එවන ලෙසසාමජිකයන්ට ඇරයුම් කරමු. (ඔබගේ තොරතුරු bocpenassn@yahoo.com ඊමේල් ලිපිනයට හෝ 0712433592 වට්ස්ඇප් අංකයට යොමු කරන්න.)

## 06. ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගේ අභාවයන්

ඉතා කෙටි කාලයක් තුල අපගේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් කිහිප දෙනෙක්ම අප අතරින් වියෝ වූ බව කනගාටුවෙන් දන්වා සිටිමු. පහත පලවන්නේ ඔවුන් වෙනුවෙන් ලියැවුනු මතක සටහන් කිහිපයකි.

1) ගෝර්ඩන් ප්‍රනාන්දු මහතා

ගෝර්ඩන් ප්‍රනාන්දු මහතා පසුගියදා අභාවප්‍රාප්ත වන තෙක්ම අප සංගමයේ ජීවතුන් අතර සිටි ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා වශයෙන් හඳුනාගෙන තිබුණි. ඔහු ලංකා බැංකුවට ආධුනික ලිපිකරුවෙකු වශයෙන් බැඳෙන්නේ 1940 වසරේ දීය. එවකට ලංකා බැංකුව පාර්ලිමේන්තු පනතකින් බිහි කළ පුද්ගලික බැංකුවක් විය. ඔහු පළමු පත්වීම ලැබුවේ ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවටයි. එවකට එම ශාඛාව පිහිටා තිබුණේ ගැස්පහ හන්දියේ පැරණි නගර සභා ගොඩනැගිල්ලේයි. මැනිං වෙළඳපොළ පිහිටා තිබුණේ ද එම ගොඩනැගිල්ලේම බිම් මහලේ ය. එවකට එම ශාඛාවේ නිෂ්කාශන අංශයේ සේවය කළ ගෝර්ඩන් ප්‍රනාන්දු මහතා මහ බැංකු ගොඩනැගිල්ලේ පිහිටි නිශ්කාශන මැදුරේ (Clearing House) කටයුතු වලට තම

බැංකුව නියෝජනය කරමින් සහභාගි විය. ඔහු ඒ සඳහා බොහෝ විට ගැස්පහ සිට කොටුව දක්වා ගමන් කළේ ට්‍රෑම් රථයෙනි. පිටකොටුව ශාඛාවෙන් ස්ථාන මාරු ලැබ යෝර්ක් වීදිය ශාඛාවට මාරු වී ගිය ඔහු පසුව ජාඇල, කුලියාපිටිය, අම්පාර සහ පානදුර ශාඛා වල සේවය කර තිබේ. ඔහු විශ්‍රාම ගන්නා විට බැංකුවේ දිස්ත්‍රික් කළමනාකාර ධූරය හෙබවීය.

1979 වර්ෂයේ ලංකා බැංකු විශ්‍රාමික සංගමය පිහිට වූ අතර එහි ආරම්භක රැස්වීමට මොහු සහභාගී විය. එය පැවැත්වූයේ ග්‍රීන්පාත් හි පිහිටි GFS ශාලාවේදීය. එවකට සංගමයේ මුළු සාමාජික සංඛ්‍යාව 150ක් විය. ආරම්භයේදී සංගමයේ කමිටු සාමාජිකයෙකු වූ ගෝර්ඩන් ප්‍රනාන්දු මහතා පසුව එහි ප්‍රධාන ලේකම් ධූරයට පත්ව දීර්ඝ කාලයක් සේවය කර අවසානයේ සංගමයේ උප සභාපති ධූරයට පත්විය. (ගෝර්ඩන් ප්‍රනාන්දු මහතා විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ "සක්හඬ" සඟරාවට සැපයූ Nostalgic Memories of a Senior Pensioner යන ලිපිය ඇසුරිනි)

2) ආර්. විශාක පෙරුමාල් මහතා

විශාක පෙරුමාල් යනු ලංකා බැංකුවේ විශේෂයෙන් විශ්‍රාමික සංගමයේ බොහෝ දෙනෙකු දන්නා හඳුනන චරිතයකි. මුල් වකවානුව තුළ සංගමයේ කමිටු සාමාජිකයෙකු වශයෙන් සෑම රැස්වීමකටම වාගේ සහභාගි වෙමින් තම ක්‍රියාශීලී දායකත්වය ඊට නොමඳව ලබා දුන්නේය. පසු කාලය වන විට වයෝවෘද්ධභාවය නිසා ඔහුගේ දෙපා ඔහුට වලංගු නොවුවත් සෑම සංවත්සර මහා සභා රැස්වීමකටම නොවරදවා ඔහු සහභාගි වූයේ හැරමිටි වාරුවෙනි.

නගර කාර්යාලයෙන් බැංකු සේවාව ඇරඹූ හෙතෙම පසුකාලීනව හැටන්, ගම්පොල වැනි දුරස්ථ ශාඛා වල සේවය කළේය. අවසානයේ ඔහු ලංකා බැංකුවේ විශ්‍රාම නඩත්තු අංශයේ කළමනාකරු වශයෙන් ස්ථාන මාරු ලැබීය.

අනුන්ගේ යහපතේදී මෙතුමා දැක්වූ මුදිතා ගුණය ඔහුගේ පෞරුෂයේ කැපී පෙනෙන ගුණාංගයක් විය. හින්දු ආගමෙන් ලද මනා ශික්ෂණයත්, දෙවියන් කෙරෙහි දැක් වූ අසීමිත භක්තියත්, අන්‍යාගමිකයන් කෙරේ දැක්වූ නොමඳ ගෞරවයත්,. මිශ්‍ර සමාජයක් තුළ ඔහුව ඉහළට ඔසවා තැබූ උත්තේජකයන් විය.

බැංකුවෙන් විශ්‍රාම යන සියලුම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප සහතික කිරීම සඳහා විශ්‍රාම භාර අරමුදල (Pension Trust Fund) ක් පිහිටුවිය යුතුය යන අදහස කරලියට එන්නේ මේ වකවානුව තුළ ය. ඒ සම්බන්ධයෙන් පුරෝගාමී මෙහෙවරක්

සිදුකළ එම්. ශිවගනනාදන්, ඒ.එල්. අබේගුණවර්ධන වැනි ඉහළ කළමනාකාරීත්වය නියෝජනය කළ මහත්වරුන්ෙගේ සහායට විශාක පෙරුමාල් මහතාද එක්විය.

එසේම වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලක් පිහිටුවීම සඳහා ද විශ්‍රාම නඩත්තු අංශයේ කලමනාකරු හැටියට විශාක පෙරුමාල් මහතා විශාල මෙහෙවරක් ඉටු කරන ලදී.

3) රංජිත් මුණසිංහ මහතා

ලංකා බැංකු සේවක සංගමයේ ලංකා බැංකුව ශාඛාවේ සභාපතිවරයා වශයෙන් දීර්ඝ කාලයක් කටයුතු කළ රංජිත් මුණසිංහ මහතා පසුව ලංකා බැංකු සේවක සංගමයේ ලේකම් ධුරයට පත්විය. ඒ කාලය තුළ සාමාජික යහපත වෙනුවෙන් කළමණාකාරීත්වය හා ගැටෙමින් ලබා දුන් වරප්‍රසාද බොහෝය. විශ්‍රාම ගැනීමෙන් පසුව විශ්‍රාමික සංගමයේ ක්‍රියාකාරි සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරමින් එහි මව් සංගමයේ භාණ්ඩාගාරික වශයෙන් මෙන්ම උප සභාපති වරයෙකු වශයෙන්ද කටයුතු කරන ලදී. ජීවිතයෙන් සමු ගන්නා අවස්ථාව වන විට ඔහු මව් සංගමයේ උප සභාපති වරයෙකු වශයෙන් පාලන කමිටුව නියෝජනය කළේය. තම ජීවිතයේ අවසාන කාල පරිච්ඡේදය තුළ ඔහු ඉතා උනන්දුවෙන් ක්‍රියා කළේ විශ්‍රාමිකයන්ගේ වෛද්‍යාධාර ක්‍රමය සක්‍රිය සේවයේ සාමාජික වෛද්‍යාධාර ක්‍රමය සමඟ සම කර ගැනීමටය. විශ්‍රාමික සංගමය නියෝජනය කළ කාල පරිච්ඡේදය තුළ සංගමයට නව ව්‍යවස්ථාවක් සැකසීම, සංගමය මගින් නව වෛද්‍යාධාර ක්‍රමයක් (SRF I & II) ඇරඹීම, විශ්‍රාමිකයන්ගේ වැටුප් වැඩි කර ගැනීම, විශ්‍රාම භාර අරමුදලේ සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම, විශ්‍රාමික විශේෂ වෛද්‍යාධාර කමිටුවේ සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම මෙන්ම අප සාමාජිකයන්ගේ ආබාධිත දරුවන්, දෙමාපියන්ගේ ඇවෑමෙන් අනාථ තත්ත්වයට පත්වීමට තිබූ ඉඩකඩ වළකාලමින් ඔවුන් ලංකා බැංකු වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලලේ ලියාපදිංචි කර ජීවිතාන්තය දක්වා ඔවුන්ට යැපුම් දීමනාවක් ලබාදීමට පෙරමුණ ගැනීම, කොළඹ දිස්ත්‍රික්කයේ කලා හා සාහිත්‍ය කටයුතු වල නියැලෙන සාමාජිකයන් ඒකරාශී කොට ‘‘පහන් ටැඹ බැබළවූ නිර්මාණ කේන්ද්‍රය’’ නමින් සංවිධානයක් පිහිටුවීමට පුරෝගාමී වීම මෙන්ම කොළඹ දිස්ත්‍රික්කය තුළ ‘‘දිරියධර මාපිය

සංවිධානය - 2021'' නමින් නවතම සංවිධානයක් ඇති කොට වැන්දඹු හා වැන්දඹු පුරුෂ වශයෙන් එම සංවිධානයේ සාමාජිකත්වය ලැබූ සාමාජිකයන්ගේ අන්‍යෝන්‍ය සුභදතාවය වර්ධනය කිරීම සඳහා මූලිකව කටයුතු කිරීම ආදී විවිධ පරාසයන් තුළ විහිදී ගිය ක්ෂේත්‍රයන්හි නියැලී තම උපරිම දායකත්වය ලබා දුන්නේය.

ඔහු දීර්ඝ කාලීනව අසනීපයෙන් පෙළුනද ඒ කිසිවකින් නොසැලී විශ්‍රාමික සංගමයේ සුපුරුදු රාජකාරිය උපරිම අයුරින් සිදු කරමින් සෑම කමිටු රැස්වීමට සහභාගී වෙමින් ක්‍රියා කළ ආකාරය නව සාමාජිකයන්ට ඔහු ලබා දුන් මහඟු ආදර්ශයකි.

4) අමිල පීරිස් මහතා

අමිල පීරිස් මහතා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පළමු වතාවට මෙවර විශ්‍රාමිකයන්ගේ සංගමයේ කමිටු සාමාජිකයකු වශයෙන් තේරී පත්විය. ඔහු ලංකා බැංකු සේවක සංගමයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන් දීර්ඝ කාලයක් කටයුතු කළේය. කොළඹ දිස්ත්‍රික්කයේ කෝට්ටේ ඒකකයේ සාමාජිකත්වය දැරූ ඔහු ප්‍රදේශයේ සමාජයීය මෙන්ම ආගමික කටයුතු වලදී ක්‍රියාශීලී දායකත්වයත් දැරීය. මිය යන තෙක්ම ලංකා බැංකුවේ විශ්‍රාමිකයන්ගේ සංගමයේ සෑම රැස්වීමකටම සහභාගී වූ ඔහු විශ්‍රාමිකයන්ගේ වෛද්‍යාධාර වැඩි කරගැනීමේ සෑම පියවරකටම නොමඳ සහයෝගයක් ලබා දුන්නේ ය. ස්වභාවයෙන්ම නිහඬ චරිතයක් වූ ඔහු යහපත් ගතිගුණ වලින් පිරි කාගෙත් හිතවතෙකු විය.

5) නිමල් පෙරේරා මහතා

1969 වර්ෂයේ කණිෂ්ඨ ලිපිකරුවෙකු / සහායක අයකැමිවරයෙකු වශයෙන් ලංකා බැංකුවට බැඳුණු නිමල් පෙරේරා මහතා වර්ෂ 39 ක දීර්ඝ සේවා කාලයකින් පසුව 2018 වර්ෂයේ දී විශ්‍රාම දිවියට එළඹිණ. එදා මෙදා තුර ඔහුගේ භූමිකාවේ වැදගත්ම අංශය නියෝජනය වන්නේ වෘත්තීය සමිති නායකයකු වශයෙන් ඔහු ඉටුකළ කාර්යය භාරයයි. වර්ෂ ගණනාවක් ලංකා බැංකු සේවක සංගමයේ භාණ්ඩාගාරික ධූරය හෙබ වූ මොහු පසුව එහි සභාපති ධූරයටද පත්විය. එසේම

ලංකා බැංකු සේවක සංගමයේ ලංකා බැංකු ශාඛාවේ ලේකම්වරයෙකු වශයෙන් ද ඔහු කටයුතු කළේය.

අභීත හඬ, උච්ච ස්වරය සහ අසාධාරණයට එරෙහිව දැක්වූ සටන්කාමීත්වය ඔහුටම අනන්‍ය වූ සුවිශේෂී ගුණාංගයක් විය. වෘත්තීය සමිති නායකයකු වශයෙන් තම සහෝදර සේවක ප්‍රජාව වෙත විවිධ ජයග්‍රහණ අත්කර දීමට ඔහු සමත් විය. ඒ අතරින් කැපී පෙනෙන ජයග්‍රහණයක් වන්නේ ඔහුගේ නායකත්වයෙන් ලබාගත් ජීවන අංක දීමනාව යි. (COLA) අද අප විශ්‍රාමිකයන් වශයෙන් භුක්ති විඳින්නේ එහි ප්‍රතිඵලයයි. ඒ හැරුණු විට උතුරු නැගෙනහිර ප්‍රදේශවල පැවති යුධ වාතාවරණය තුළ අවදානමකට ලක්ව සිටි බැංකු සේවකයන්ට සහනයක් වශයෙන් යුධ දීමනාවක් ලබාදීමට ද ක්‍රියා කළේය. එසේම අසාධාරණයට ලක් වූ බැංකු සේවකයන් වෙනුවෙන් පෙනී සිට ඔවුන් මුදවා ගැනීමට ගත් ප්‍රයත්නය ද අගය කළ යුතුය. ඔහුගේ නායකත්වයෙන් දියත් වූ වෘත්තීය සමිති අරගලවලදී අනේකවිධ දුෂ්කරතාවයන්ට මෙන්ම මැර ප්‍රහාර වලට ද මුහුණ දීමට ඔහුට සිදුවිය.

අනෙක් අතට නිමල් පෙරේරා මහතා බැංකු නිලධාරියෙකු වශයෙන් තම ආයතනයටද උපරිම අයුරින් සේවය කළේය. ඔහුගේ එම සේවාවේ කැපී පෙනෙන අංශය වූයේ අයකර ගැනීමේ නිලධාරියකු වශයෙන් කල් ඉකුත් වූ බොහෝ ණය මුදල් සාර්ථක ලෙස අයකර ගැනීමට ක්‍රියා කිරීමයි.

2008 වර්ෂයේ විශ්‍රාම ගැනීමෙන් අනතුරුව ලංකා බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයට බැඳුණු ඔහු විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ජ්‍යේෂ්ඨ නායකයෙකු වශයෙන් තනතුරු හොබවමින් මිය යන තුරුම තම දායකත්වය ලබා දුන්නේය. එමෙන්ම මව් සංගමයේ කමිටු සාමාජිකයෙකු වශයෙන් වර්ෂ ගණනාවක් ස්වෙච්ඡාවෙන් ඉටු කළ කාර්යභාරය ප්‍රශංසනීය වේ. විශ්‍රාම භාර අරමුදලේ සාමාජිකයෙකු වශයෙන්ද සංගමය නියෝජනය කරමින් බොහෝ කාලයක් ඔහු කටයුතු කළේය.

ජාති, ආගම්, කුල මල භේද කිසිවක් නොදැක්වූ නිමල් පෙරේරා මහතාගේ ශබ්දකෝෂයේ මුලටම එන්නේ "මචං" යන්නයි. එය ඔහු දැක්වූ සහෝදරත්වයේ සංකේතයයි.

නායකත්වය තුලින් පෞද්ගලික අභිමතාර්ථයන් සාධනය කර ගැනීමේ නිහීන ප්‍රතිපත්තිය වෙනුවට තම පෞද්ගලික අභිමතාර්ථයන් පසෙකලා තම සහෝදර ප්‍රජාවට සෙත සැලසීමේ උදාර ගුණාංගය ඔහුගේ පෞරුෂයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූ අතර එය වර්තමාන පරපුරට මහඟු ආදර්ශයකි.

# අපගේ
# අම්පාර දිස්තත්‍රික් සභාපති මෙවර
# <u>රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලබයි!</u>




ලංකා බැංකුවේ විශාමිකයන්ගේ සංගමයේ අම්පාර දිස්ත්‍රික් සංවිධානයේ වර්තමාන සභාපති එම්.එල්.එම් ෆාරුක් මහතා 2023 රාජ්‍ය සාහිත්‍ය උත්සවයේ දි ඔහු විසින් ලියා පලකල "පාවේන්දල් ගීත" නැමැති ද්‍රවිඩ කාව්‍ය ග්‍රන්ථය සඳහා රාජ්‍ය සාහිත්‍ය සම්මානය දිනා ඇති බව සතුටින් දන්වා සිටිමු.

වසර 36 ක බැංකු සේවාවකින් පසු 2013 වසරේ දි ලංකා බැංකුව නින්නවුර් ශාඛාවෙන් විශ්‍රාම දිවියට එළැඹි ෆාරුක් මහතා වවුනියාව ශාඛාවෙන් සේවා දිවිය අරඹා අම්පාර දිස්තික්යේ පිහිටි සියලුම සේවා ස්ථානවල පාහේ සේවය කළ ජනප්‍රිය නිළධාරියෙකි.

වසර පනහකට අධික කාලයක් තිස්සේ දෙමළ පාඨක ප්‍රජාව තුල පාල්මුනේ ෆාරුක් නමින් ජනප්‍රිය වී සිටින ෆාරුක් මහතා මේ වන විට ග්‍රන්ථ දහයකට අධික ප්‍රමාණයක් ලියා පලකර ඇත. ඒවා අතර "පදම්"(1987) , "චන්දනප් පොයිකයි"(2009) ,"කොන්දලිප්පු"(2010), "තෝට්ටුපායි මුත්තම්මා"(2011) , එන්ජියිරුන්ද ප්‍රාර්ථනයියෝඩු(2012) , "පාලමුණේ ෆාරුක් කුරුම්පාක්කල්" (2013) , "වැලයික්කුල් මැලර්න්ද වැනප්පු" (2017) , "පාලමුණේ ෆාරුක් නවීන කාව්‍යංගල් මූන්රු" (2020) , "මීලප්ප පරක්කුම් නංගනංගල්" (2020) , "පායේන්දල් ගීත" (2022) ද වේ.

රාජ සම්මානයට පාත්‍ර වු පාලමුනේ ෆාරුක්(එම්. එල්.එම්.ෆාරුක්) මහතාට අපගේ සුභ පැතුම් පිරිනමමු.

# 8. ලංකා බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයට 2023/ 2024 වර්ෂය සඳහා නව නිලධාරි මණ්ඩලයක්

2023.04.29 දින ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටල්යේදී පැවැත්වු සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී පහත සඳහන් නිලධාරි මණ්ඩලය හා කමිටු සාමාජිකයන් තේරී පත්විය.

1* නිලධාරි මණ්ඩලය
- එම්. සුකුමාරන් මහතා - සභාපති
- එල්.ජී.අබේසිරිගුණවර්ධන මහතා - ආසන්නතම හිටපු සභාපති
- එල්.එස්.ද එස්.ඒ.විජේනායක මහතා - ප්‍රධාන ලේකම්
- පී.වීරසිංහ මහතා - භාණ්ඩාගාරික
- ලලිත් හේමසිරි මහතා - උප සභාපති
- කිව්.පතිරණගේ මහතා - උප සභාපති
- ආර්.මුණසිංහ මහතා - උප සභාපති (2023 අගෝස්තු 24 දින සිට එන්.ඒ.බී.විතානගේ මහතා පත් විය )
- එස්.ද සිල්වා මහතා - උප ලේකම්
- කේ.එල්.ඒ.හේමරත්න මහතා - උප ලේකම්
- ඒ.ජී.තක්සල මහතා - උප භාණ්ඩාගාරික

2* කමිටු සාමාජිකයන්
- එම්.වික්‍රමසිංහ මහතා
- එච්.එල්.ඒ.වනිගසේකර මහතා
- එන්.ඒ.බී.විතානගේ මහතා (2023 ජුලි 26 දින සිට එච්.එම්.අබේසේකර මහතා පත් විය)
- ඒ.ඒ.සිරිසේන මහතා
- ඩබ්.ඒ.සුගතදාස මහතා
- බී.ඒ.ඕ.වී.ඒ.පිරිස් මහතා (2023 අගෝස්තු 24 දින සිට එස්.එස්.පෙරේරා මහතා පත් විය )
- ඩබ්.ටී.කේ රත්නායක මහතා- කුරුණෑගල දිස්ත්‍රික්කය
- පී.ප්‍රනාන්දු මහතා - කෑගල්ල දිස්ත්‍රික්කය
- එස්.හෙට්ටිආරච්චි මහතා - මාතර දිස්ත්‍රික්කය
- ඩබ්.රංජිත් මහතා - අනුරාධපුරය දිස්ත්‍රික්කය
- පී.වී.ලීලාරත්න මහතා - ගාල්ල දිස්ත්‍රික්කය
- ජී.බෝගස්වත්ත මහතා - නුවර එළිය

- ඩී.අබේසිංහ මහතා - මරණාධාර කමිටුවේ සභාපති
- ඩබ්.ඩී.අරියසේන මහතා - මරණාධාර කමිටුවේ ලේකම්
- කේ.ප්‍රනාන්දු මහත්මිය - මරණාධාර කමිටුවේ භාණ්ඩාගාරික